# අ.පො.ස උසස් පෙළ



# ගිණුම්කරණය




## මූලාශ්‍ර ලේඛණ

# මූලාශ්‍ර ලේඛණ

## 4.5.5 - ආපසු යැවුම් ජ'නලයේ අවශ්‍යතාවය හා මූලාශ්‍ර ලේඛන.

◆ ආපසු යැවුම් ජ'නලය පැහැදිලි කරන්න.

✓ පිළිතුර

වෙළඳ භාණ්ඩ ණයට ගැනුම් විවිධ හේතු නිසා වෙළඳ ණයහිමියන් වෙත ආපසු යැවීමේදී එවා වාර්තා කිරීම සඳහා භාවිතා කරන මූලික සටහන් පොත ආපසු යැවුම් ජ'නලය වේ.

◆ වෙළඳ භාණ්ඩ ආපසු යැවීමට හේතු දක්වන්න.

✓ පිළිතුර

- ඇණවුම් කල වර්ගයේ භාණ්ඩ නොවීම.
- ඇණවුම් කල ප්‍රමාණයට වඩා වැඩියෙන් සපයා තිබීම.
- කාලය ඉකුත් වූ භාණ්ඩ සපයා තිබීම.
- ප්‍රවාහනයේදී හානි වී තිබීම.

◆ ආපසු යැවුම් ජ'නලයේ අවශ්‍යතාවය දක්වන්න.

✓ පිළිතුර

- ව්‍යාපාරයේ වෙළඳ භාණ්ඩ ණයට ගැනුම් ආපසු යැවීම පිළිබඳ තොරතුරු විස්තරාත්මකව සටහන් තැබීම.
- ආපසු යැවුම් ජ'නලයේ සාරාංශ කල තොරතුරු පොදු ලෙජරයට පිටපත් කල හැකිවීම.

අන්තර්ගතය - ඩී.එම්.එස්.දිසානායක මයා,කු/මලියදේව (පිරිමි විද්‍යාලය),කුරුණෑගල.
යූ.බී.ධර්මදාස මයා,අ/තඹුත්තේගම විද්‍යාලය, තඹුත්තේගම
යූ.අතුල ඒකනායක මයා,මා/ශාන්ත තෝමස් විද්‍යාලය,මාතලේ
සැකසුම - ඩබ්.එම්.සී.එම්.බණ්ඩාර , බ /කන්දෙගෙදර ජාතික පාසල.

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

◆ ආපසු යැවුම් ජ’නලයක ගනුදෙනු සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලේඛණ දක්වන්න.

✓ පිළිතුර

- හරපත

**Deposit**

Date ______________________

Name ______________________

Account Number ______________________

**The Money Bank**
Cashton, NC 22222

| | | |
|---|---|---|
| CASH | | |
| CHECKS | | |
| | | |
| | | |
| | | |
| | | |
| Subtotal | | |
| Less Cash | | |
| TOTAL | | |

◆ හරපතක ඇතුලත් තොරතුරු දක්වන්න.

✓ පිළිතුර

- හරපත් අංකය
- හරපත පිළියෙල කල දිනය
- ගනුදෙනුවට සම්බන්ධ පාර්ශව
- ගනුදෙනුව පිළිබඳ විස්තර
- වටිනාකම
- වෙළඳ වට්ටම්
- කොන්දේසි
- බලයලත් නිලධාරියාගේ අත්සන



අන්තර්ගතය - ඩී.එම්.එස්.දිසානායක මයා,කු/මලියදේව (පිරිමි විද්‍යාලය),කුරුණෑගල.
යූ.බී.ධර්මදාස මයා,අ/තඹුත්තේගම විද්‍යාලය, තඹුත්තේගම
යූ.අතුල ඒකනායක මයා,මා/ශාන්ත තෝමස් විද්‍යාලය,මාතලේ
සැකසුම - ඩබ්.එම්.සී.එම්.බණ්ඩාර , බ /කන්දෙගෙදර ජාතික පාසල.

Copyright © e-thaksalawa.moe.gov.lk